# බප/ජය. සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
## පළමු වාර පරීක්ෂණය - 2012
## ඉතිහාසය

ල. ...............

11 ශ්‍රේණිය .........

නම / විභාග අංකය: ................................................................... කාලය : පැය 02 යි.

## I කොටස

* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

* නිවැරදි වරණය තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ ඉංග්‍රීසින් විසින් ලන්දේසින් ගෙන් පවරා ගනු ලැබුවේ කිනම් වර්ෂයකදීද?

(i) ක්‍රි. ව. 1453 (ii) ක්‍රි. ව. 1776
(iii) ක්‍රි. ව. 1896 (iv) ක්‍රි. ව. 1796

(02) ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත් වූයේ කවර වර්ෂයකදීද?

(i) ක්‍රි. ව. 1825 (ii) ක්‍රි. ව. 1802
(iii) ක්‍රි. ව. 1803 (iv) ක්‍රි. ව. 1806

(03) කියු ලිපිය අනුව ක්‍රියා කිරීමට අකමැති වූ එවකට ලංකාවේ සිටි ලන්දේසි ආන්ඩුකාරවරයා කවුද?

(i) තෝමස් වැන්රි (ii) ෆන් එංගල්බෙක්
(iii) ජාන් ස්කෑන්දර් (iv) ජර්මිදකියර්

(04) ද්විත්ව පාලනය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූයේ කවර කාලයකදීද?

(i) 1796-1798 (ii) 1798-1805
(iii) 1805-1815 (iv) 1798-1802

(05) ඉංග්‍රීසීන් විසින් බිම් පාළු ප්‍රතිපත්තියක් අනුගමනය කළේ කුමන අරගලයක් මැඩ පැවැත්වීමටද?

(i) මාතලේ කැරැල්ල (ii) වෙල්ලස්ස කැරැල්ල
(iii) ජාතිවාදී කෝලාහලය (iv) මුහුදුබඩ ප්‍රදේශවල ඇතිවූ කැරැල්ල

(06) 1948 නිදහස හිමිවීමත් සමඟ ඇති වූ සිද්ධීන් අතර නොගැලපෙන වරණය කුමක්ද?

(i) අග්‍රාණ්ඩුකාර ධූරය ඇතිවීම.
(ii) ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව
(iii) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය
(iv) විධායක කාරක සභා ක්‍රමය

(07) රබර් වගාව සාර්ථකව ව්‍යාප්ත වූ දිස්ත්‍රික් කාණ්ඩය කුමක්ද?

(i) රත්නපුර, මහනුවර, කළුතර (ii) මහනුවර, මාතලේ, කළුතර
(iii) රත්නපුරය, කෑගල්ල, කළුතර (iv) කෑගල්ල, මාතලේ, මොණරාගල

(08) බ්‍රිතාන්‍ය පාලන කාලය තුළ ශ්‍රී ලංකාව ප්‍රජාතන්ත්‍රවාදී නියෝජන ක්‍රමයක් කරා යන ගමනේදී සිදුවූ වැදගත්ම අණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය වූයේ,
(i) මැකලම් (ii) ඩොනමෝර්
(iii) කෝල්බෲක් (iv) සොල්බරි

(09) පංචමහා වාද පැවැත්වූ ස්ථාන නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.
(i) බද්දේගම, ගාල්ල, වරාගොඩ, පානදුර, රයිගම
(ii) පානදුර, ගම්පොළ, වරාගොඩ, උදම්විට, බද්දේගම
(iii) බද්දේගම, පානදුර, කළුතර, රයිගම, හොරණ
(iv) බද්දේගම, පානදුර, මහනුවර, ගාල්ල, මාතර

(10) ශ්‍රී ලංකාවට පැමිණි මුල්ම ආර්ය කණ්ඩායම ජනාවාස ඉදිකිරීම් සඳහා යොදා ගත්තේ කිනම් ගංගා නිම්නයද?
(i) කල්‍යාණි නදී (ii) ජජ්ජර නදී
(iii) කදම්බනදී (iv) කිරින්ද නදී

(11) ''කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත'' යන විරුද නාමයෙන් හඳුන්වන සිංහල රජතුමා කවුරුන්ද?
(i) පරාක්‍රමබාහු (ii) II පරාක්‍රමබාහු
(iii) IV පරාක්‍රමබාහු (iv) VI පරාක්‍රමබාහු

(12) ඔල්කොට තුමාගේ මූලිකත්වයෙන් පිහිටුවන ලද සුප්‍රසිද්ධ පිරිවෙන කුමක්ද?
(i) පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙන
(ii) පරම ධම්ම චේතිය පිරිවෙණ
(iii) විද්‍යාලංකාර පිරිවෙණ
(iv) මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙණ

(13) ලෝක සංස්කෘතික උරුමයක් ලෙස සළකන ගාලු කොටුව ඉදිකරවන ලද්දේ කවුරුන් විසින්ද?
(i) ඉංග්‍රීසීන් (ii) ලන්දේසීන්
(iii) ප්‍රංශයින් (iv) පෘතුගීසීන්

(14) ක්‍රි. ව. 1921 දී පිහිටුවන මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේදී ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයින් ගණන කොපමණද?
(i) 37 (ii) 49 (iii) 21 (iv) 61

(15) බ්‍රිතාන්‍ය පාලන සමයේදී පිහිටුවන ලද ව්‍යවස්ථාදායක සභාවට උසස් ලාංකිකයන්ගේ ඡන්දයෙන් ප්‍රථමවරට තෝරාගත් නියෝජිතයා කවරෙක්ද?
(i) පොන්නම්බලම් අරුනාචලම් (ii) පොන්නම්බලම් රාමනාදන්
(iii) ශ්‍රීමත් ජේම්ස් පීරිස් (iv) අරුමුග නාවලර්

(16) A ටොරින්ටන් සාමි B ආතර්ගෝඩන් C රොබට් බ්‍රවුන්රිස්
D විලියම් ග්‍රෙගරි E හෙන්රි වෝඩ්
ඉහත දක්වෙන ආණ්ඩුකාරවරුන් අතුරෙන් දේශීය කෘෂිකර්මාන්තයට සේවයක් කළ ආණ්ඩුකාරවරු පමණක් ඇතුළත් නිවැරදි පිළිතුර කුමක්ද?
(i) ABC (ii) ACD
(iii) BDE (iv) BCD

(17) කම්කරු උද්ඝෝෂණ ව්‍යාපාරයන්හි නායකත්වය ඉසිලුවේ මින් කවුරුන්ද?

(i) එස්. ඒ. වික්‍රමසිංහ (ii) එන්. එම්. පෙරේරා

(iii) පීටර් කේනමන් (iv) ඒ. ඊ. ගුණසිංහ

(18) දෙවන නිදහස් අරගලයට බලපෑ ආසන්නතම හේතුව වන්නේ,

(i) මුස්ලිම් මුහන්දිරම් වරයකු පත් කිරීම.

(ii) අසාධාරණ බදු අය කිරීම.

(iii) ඉඩම් අහිමිවීම

(iv) ගම් සභා නැති කිරීම

(19) ජාතික ආගමික පුනරුදය හා සම්බන්ධ වූ නායකයින් නිවැරදිව ගැලපූ විට පිළිතුර තෝරන්න.

| | | | |
|---|---|---|---|
| (i) | හෙන්රි ස්ටීල් ඕල්කොට් තුමා | A | මහාබෝධි සමාගම ඉදිකිරීම |
| (ii) | අනගාරික ධර්මපාල තුමා | B | පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවීම |
| (iii) | ආරුමුග නාවලර් තුමා | C | ඥාණ ප්‍රදීප පුවත්පත ඇරඹීම |
| (iv) | සිද්ධි ලෙබ්බේ | D | වර්නාපිපන්නෙය..... පාසැල ඉදි කිරීම |
| | | E | පානදුරාවාදය ඇති කිරීම. |

(i) BCDE (ii) BADC

(iii) BACD (iv) BCDE

(20) රබර් පර්යේෂන ආයතනය පිහිටා ඇත්තේ කවර ස්ථානයකද?

(i) කෑගල්ල (ii) රත්නපුර

(iii) අගලවත්ත (iv) කළුතර

(21) වතු කම්කරුවන්ගේ උද්ඝෝෂණ ව්‍යාපාරවල නායකත්වය ගත්තේ මොහුය

(i) ආරුමුග නාවලර් (ii) පොන්නම්බලම් අරුනාවලම්

(iii) නටේසර් අයියර් (iv) පොන්නම්බලම් රාමනාදන්

(22) බොරෝබුදූර් විහාරය පවතින රට වනුයේ

(i) බුරුමය (ii) ඉන්දියාව

(iii) චීනය (iv) ජාවා

(23) මෙරට ආරම්භ වූ ප්‍රථම ගොවිජනපද ව්‍යාපාරය වූයේ

(i) රාජාංගනය (ii) කන්තලේ

(iii) කලාවැව (iv) මින්නේරිය

(ලකුණු 23 x 2 = 46

## II කොටස

* පළමු වන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.

(01) (i) සපයා ඇති ලංකා සිතියමෙහි පහත සඳහන් ස්ථාන ලකුණු කොට නම් කරන්න.

1. මහාතිත්ථ
2. ජජ්ජර නදී
3. කොළඹ
4. ගල්ඔය ජලාශය
5. කාජරගාම
6. මිනිපේ අමුණ
7. වනවාහිනී නදිය
8. සෙංකඩගල
9. හුරුළු වැව
10. දෙවිනුවර

(ලකුණු 10)

(ii) සපයා ඇති ලෝක සිතියමෙහි පහත සඳහන් ස්ථාන ලකුණු කොට නම් කරන්න.

1. රෝමය
2. සුබ ප්‍රාර්ථනා තුඩුව
3. කොරියානු අර්ධද්වීපය
4. සින්ධු නදිය
5. කොන්ස්තන්තිනෝපලය
6. පර්සියන් බොක්ක
7. බොරෝ බුදූර්
8. පීකිං

(ලකුණු 08)

(02) (i) පහත සඳහන් සිද්ධීන් හා සම්බන්ධ පුද්ගයින් නම් කරන්න.

A - පළමු බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා

B - 1815 න් පසු උඩරට ප්‍රදේශ පාලනය සඳහා පත් කළ බ්‍රිතාන්‍ය නේවාසික නිලධාරියා.

C - 1848 බ්‍රිතාන්‍ය විරෝධී අරගල සමයේ මෙරට සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා.

(ලකුණු 03)

(ii) උඩරට ප්‍රදේශවල කෝපි වගාව ව්‍යාප්ත වීමට බලපෑ සාධක දෙකක් දක්වන්න.

(ලකුණු 04)

(iii) දේශීය කෘෂිකර්මය නගා සිටුවීමට කටයුතු කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු දෙදෙනකුගේ සේවය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) වතු වගාව නිසා මෙරට ආර්ථිකයේ ඇතිවූ වෙනස්කම් තුනක් විග්‍රහ කර දක්වන්න.

(ලකුණු 06)

(03) (i) පහත සඳහන් වැදගත් සිදුවීම් වලට අදාළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ නම සහ වර්ෂය ලියා දක්වන්න.

A - සර්වජන ඡන්ද බලය ලැබීම.

B - ප්‍රථම වරට අගමැති වරයකු පත්වීම.

C - ව්‍යවස්ථාදායක විධායක සභා ක්‍රමය ඇති කිරීම. (ලකුණු 03)

(ii) කොල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා දෙකක් කෙටියෙන් ලියා දක්වන්න.

(ලකුණු 04)

(iii) බටහිර කරණය නිසා මෙරට ඇතිවූ මධ්‍යම පංතිකයන් පිළිබඳව කෙටි විග්‍රහයක් කරන්න. (ලකුණු 05)

(iv) කම්කරු උද්ඝෝෂණ ව්‍යාපාරවල මුලිකත්වය ගත්තේ කවරෙක්ද? කම්කරු ව්‍යාපාරය පිළිබඳව කෙටි ඇගයීමක් කරන්න. (ලකුණු 06)

(04) (i) ද්විත්ව පාලනය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)


(ii) 1818 කැරැල්ල පිළිබඳ පහත සඳහන් තොරතුරු ලියා දක්වන්න.


1. ආරම්භ වූ ස්ථානය.
2. නායකත්වය දුන් ප්‍රධාන තැනැත්තා.
3. ඇතිවීමට බලපෑ ආසන්න හේතුව.
4. එයින් ඇති වූ ප්‍රධාන ප්‍රතිඵලයක්.

(ලකුණු 04)

(iii) 1848 කැරැල්ල ඇතිවීමට බලපෑ ආසන්න හේතුව හා තවත් හේතු 02 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයන් සතුවීම කෙරෙහි බලපෑ ප්‍රධාන හේතු 02 ක් විග්‍රහ කොට දක්වන්න. (ලකුණු 06)


N


N